(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 61.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021** මාර්තු **24** බදාදා පූ. භා. **10.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍යකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෛයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ජගත් කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු  සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු  උද්දික ප්‍රේමරත්න මහතා

ගරු  (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු  රෝහණ බංඩාර මහතා

ගරු  ශාන්ත බණ්ඩාර මහතා

ගරු  සුදත් මංජුල මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  කේ. කාදර් මස්තාන් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  ඉම්ටියාස් බාකීර් මාකාර් මහතා

ගරු  එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු  මොහමඩ් මුසම්මිල් මහතා

ගරු  අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු  නිපුණ රණවක මහතා

ගරු  බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු  (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු  කුමාරසිරි රත්නායක මහතා

ගරු  අලි සබ්රි රහීම් මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  අජිත් රාජපක්ෂ මහතා

ගරු  ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු  (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු  උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු  (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු  ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු  වරුණ ලියනගේ මහතා

ගරු  ගාමිණී වලේබොඩ මහතා

ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු  රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු  සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු මහින්ද සමරසිංහ මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන 2021 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් —

(i) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) වෙළඳ අමාත්‍යවරයා විසින් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 12 දිනැති අංක 2210/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය ඉදිරිපත් කර එම නියෝගය, වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ගාමිණී ලොකුගේ මහතා වෙනුවෙන් එහි සාමාජික ගරු මොහමඩ් මුසම්මිල් මහතා, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 135(4) වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වන වගන්තිය යටතේ නියෝගය;

(ii) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 143 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වන වගන්තිය යටතේ නියෝග;

(iii) 2017 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iv) 2018 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(v) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2017 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) රත්නපුර, රත්න හංගමුව, "විදුසර" යන ලිපිනයෙහි පදිංචි ඩී. එම්. දේවිකා මහත්මියගෙන් ලැබුණු 2020.11.23 දිනැති පෙත්සම;

(ii) රත්නපුර, පලාවෙල, දම්මේ පාර යන ලිපිනයෙහි පදිංචි ඊ. එම්. ඩබ්ලිව්. ගුණතිලක මහතාගෙන් ලැබුණු 2020.09.07 දිනැති පෙත්සම;

(iii) පරකඩුව, පුස්සැල්ල යන ලිපිනයෙහි පදිංචි එච්. ඒ. වී. ඒ. නවරත්න මහතාගෙන් ලැබුණු 2021.02.02 දිනැති පෙත්සම;

(iv) හකුරුවෙල, ගජනායකගම, ඉත්ත දෙමලිය ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. ජේමවතී මහත්මියගෙන් ලැබුණු 2020.10.09 දිනැති පෙත්සම;

(v) රත්නපුර, මහවල පාර, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි ඕ. නාරද ශ්‍රී විතාරණ මහතාගෙන් ලැබුණු 2020.09.25 දිනැති පෙත්සම;

(vi) රත්නපුර, මුවගම, ශ්‍රී ඛේමානන්ද මාවත, අංක 147/1 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එස්. ඩී. ශ්‍රියානන්ද මහත්මියගෙන් ලැබුණු 2020.09.01 දිනැති පෙත්සම;

(vii) අඹකොටේ, දැදුරු නදීගම, අංක 10/4 දරන ස්ථානයෙහි පදිංචි ටී. ඒ. පී. තංගල්ල මහතාගෙන් ලැබුණු 2020.10.20 දිනැති පෙත්සම; සහ

(viii) ගැටහැත්ත, දියුරුම්පිටිය, අංක 18 බී, 50/9/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. අශෝක විජේසිංහ මහතාගෙන් ලැබුණු 2020.10.01 දිනැති පෙත්සම

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) හොරහේන, හෝකන්දර නැගෙනහිර, අංක 20/2 දරන ස්ථානයෙහි පදිංචි කේ. සිරිපාල මහතාගෙන් ලැබුණු 2021.01.18 දිනැති පෙත්සම;

(ii) කඩුවෙල, ඉහල බෝමිරිය, රක්ෂපාන පාර, අංක 147ඊ දරන ස්ථානයෙහි පදිංචි එම්. ජී. නිමල් පද්මසිරි මහතාගෙන් ලැබුණු 2021.02.22 දිනැති පෙත්සම; සහ

(iii) අතුරුගිරිය, කොට්ටාව පාර, අංක 384/16 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. ඒ. එස්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2021.01.23 දිනැති පෙත්සම

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) පොළොන්නරුව, පැලැටියාව, අංක 520 දරන ස්ථානයෙහි පදිංචි එච්. ජී. සෝමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2021.02.01 දිනැති පෙත්සම; සහ

(ii) සිරිපුර, අංක 43 (වාණිජ) දරන ස්ථානයෙහි පදිංචි ජේ. එම්. ධර්මපාල මහතාගෙන් ලැබුණු 2020.10.02 දිනැති පෙත්සම

ගරු කිංස් නෙල්සන් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) පදියතලාව, මීගස්වත්ත, රාජ්‍ය දැව සංස්ථාව ඉදිරිපිට, අංක 205 දරන ස්ථානයෙහි පදිංචි ජේ. එල්. එන්. ඩී. කුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු 2021.01.29 දිනැති පෙත්සම ගරු ඩී. වීරසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන):** කම්කරු අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,—2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 අප්‍රේල් 05 සඳුදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන):** අධිකරණ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 අප්‍රේල් 05 සඳුදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. මෝටර් වාහන පනත යටතේ නියෝගය (අංක 1):** ප්‍රවාහන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 135(4) වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 09 දිනැති අංක 2144/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අ. භා. 12.07 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

( අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 2.46 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

''ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 3.41 ට ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**7. මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2):** ප්‍රවාහන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 143 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජනවාරි 30 දිනැති අංක 2160/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් උරුත්තිරපුරච්චරම් ශිවන් කෝවිලේ සිදු කිරීමට නියමිත ගවේෂණ):** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

‘‘ගරු මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය’’යි ගරු ගාමිණී වලේබොඩ මහතා, ගරු මංජුලා දිසානායක මහත්මිය ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 4.44 ට ගරු මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව, අ. භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 මාර්තු 25 බ්‍රහස්පතින්දා පූ.භා 10.00 වනතෙක් කල් ගියේය.